# *විසුද්ධිමග්ගටීකාවේ* අනුප්‍රාස භාවිතය සහ බෞද්ධ සාහිත්‍යාගත බ්‍යඤ්ජනාර්ථ පද විග්‍රහය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක්

## අරමුණ

*පරමත්ථමඤ්ජුසා* නම් වූ *විසුද්ධිමග්ගටීකාව* අතිශය සම්භාවනීය කෘතියක් ලෙස පිළිගත යුතු වෙයි. බුද්ධඝෝෂ හිමියන්ගේ *විසුද්ධිමග්ගයේ* සුබාවබෝධය සඳහා ධම්මපාල හිමියන් විසින් ලියන ලද *විසුද්ධිමග්ගටීකාව* ධර්මාර්ථ විග්‍රහය නිසාම නොව එහි භාෂාවේ ස්වරූපය නිසාද සුවිශේෂී වෙයි. මෙම ටීකාව සංස්කරණය කළ මොරොන්තුඩුවේ ධම්මානන්ද හිමියෝ (1928) සිය නිවේදනයෙහි දක්වා ඇති අදහස්වල උපුටා ගැනීමක් මෙසේයි : "........ශාසනයේ පැවැත්ම පිණිස අත්‍යන්තයෙන් උපකාරී වූ අතිදක්‍ෂ විනිශ්චයෙන් යුත් සුකෝමල පද සමූහයෙන් අලංකාර වූ මේ ටීකාව ......" මෙම උපුටා ගැනීමෙන් කරුණු දෙකක් ඉඳුරා ප්‍රකට වෙයි. එකක් නම් ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් ලෙස මෙම කෘතියෙහි විශිෂ්ටත්වයයි. දෙවැන්න එහි භාෂාවේ සුන්දරත්වයයි. උදාර පාණ්ඩිත්‍යයක් ඇත්තකු විසින් භාෂා භාවිතයෙහි පවත්නා ස්වකීය බුහුටි බව නිසා ආයාසයකින් තොරව ම නිමවන ලද සුකෝමල බසක් මෙම කෘතියෙහි විද්‍යමාන වෙයි.

විසුද්ධිමග්ගටීකාවේ භාෂාව සුකෝමල වීමට හේතු වූ කරුණු අතර එක් මූලික කාරණයක් නම් කෘතිය පුරා අතිශය ප්‍රශස්ත අයුරින් භාවිත අනුප්‍රාසයයි. වෙනත් පශ්චාත් පේටක කෘතිවල, අටුවා වල හා ටීකාවල වෙසෙසා දක්නට නොලැබෙන මෙම ලක්ෂණය මෙම කෘතියෙහි ලේඛකයා විසින් කවර කරුණක් නිසා අවධාරණය කර ඇත්තේ ද යන්න විමසා බැලීම මෙම කෙටි ලිපියෙහි අරමුණයි. එහි දී සංස්කෘත කාව්‍ය විචාර සම්ප්‍රදායේ ආනුභාවයෙන් පසුකලෙක පාලි කාව්‍ය විචාරකයන් විසින් අනුප්‍රාස නමින් හඳුනාගනු ලැබූ ගුණය පැරණි බෞද්ධ සාහිත්‍යයෙහි වැදගත් කොට සලකනු ලැබූ බ්‍යඤ්ජනය (හෝ ව්‍යඤ්ජනය) හා සම්බන්ධයක් පවත්නා බවත්, බ්‍යඤ්ජනය ප්‍රායෝගික අර්ථයක් සලකා පැරණි සූත්‍ර සාහිත්‍යයේ භාවිත වූ බව හා එකී ප්‍රායෝගික වැදගත්කම අවධාරිතව ම විසුද්ධිමග්ගටීකාවේ අනුප්‍රාසය භාවිත කර ඇති බව හඳුනාගැනීමත් මෙහි අරමුණයි. මෙලෙස විසුද්ධිමග්ගටීකාවේ අනුප්‍රාස යෝජනය බෞද්ධ සාහිත්‍යයට අදාළ පුළුල් සන්දර්භයක සාකච්ඡා කළ යුතු බව දක්නා ලැබේ.

## අනුප්‍රාසය යනු :

අනුප්‍රාසය පදවල හෝ අක්ෂරවල පුනරුච්ඡාරණයෙන් ඇතිවන ගුණයෙකි. පාලි සාහිත්‍යයෙහි අනුප්‍රාසය පැරණි සූත්‍රපිටක සාහිත්‍ය රචනා වූ යුගයේ සිට යෙදී ඇතත් එය පාලි කාව්‍ය විචාරයෙහි සාකච්ඡා වන්නේ සුබෝධාලංකාරයෙහි ය. ඒ සංස්කෘත කාව්‍ය විචාරයට අනුගතවය (*සුබෝධාලංකාර* : ix). දෝෂ විනිර්මුක්තව කාව්‍ය නිර්මාණය කිරීම සඳහා උපදෙස් දෙන සුබෝධාලංකාරයෙහි මාධුර්ය නමැති ගුණයෙහි ප්‍රභේද දෙකකින් එකකි අනුප්‍රාසය. කාව්‍ය කරණයට උපදෙස් දෙන සුබෝධාලංකාරයෙහි අනුප්‍රාසය සම්බන්ධයෙන් කර ඇති පැහැදිලි කිරීම ම මෙහිලා අපගේ අවධානයට යොමු වෙයි (*සුබෝධාලංකාර* : 126). ප්‍රස්තුත ටීකාවෙහි අනුප්‍රාසය දක්වා ඇත්තේ සුබෝධාලංකාරයෙහි දක්වා ඇති කාව්‍යෝචිත අනුප්‍රාසයට එකඟවය. මෙයින් අප අදහස් කරන්නේ මේ ග්‍රන්ථයන්හි යම් සම්බන්ධයක් පෙන්වීමට නොව ටීකාවෙහි කතුවරයාට බෞද්ධ කාව්‍ය සාහිත්‍ය